# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1604/23 - 2009 ජුනි 03 වැනි බදාදා - 2009.06.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1980 අංක 26 දරන ආහාර පනත

1980 ජුලි මස 25 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* II වැනි කොටසට අතිරේකයක් වශයෙන් පළ කරන ලද 1980 අංක 26 දරන ආහාර පනතේ 17(2) වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව මෙම නියෝගය කරනු ලැබේ.

නිමල් සිරිපාල ද සිල්වා,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍ය.

2009 මැයි මස 25 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

පහත සඳහන් විශ්ලේෂක කොළඹ මහ නගර සභා පරිපාලන බල ප්‍රදේශය තුළ ක්ෂුද්‍රජීව විශ්ලේෂණ සඳහා අතිරේක අනුමත රස පරීක්ෂකවරියක ලෙස විය යුතු බව මෙයින් අනුමත කර ප්‍රකාශ කරනු ලැබේ:

වෛද්‍ය ඇනා කාරියවසම් මහත්මිය
නියෝජ්‍ය ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනි (ක්ෂුද්‍රජීව හා රසායනාගාර සේවා)
නාගරික ක්ෂුද්‍රජීව රසායනාගාරය,
ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
කොළඹ මහ නගර සභාව,
ආර්නෝල්ඩ් රත්නායක මාවත,
කොළඹ 08.

06 - 360

1A - G 011204 — 3430 (2009/06)

**1980 අංක 26 දරන ආහාර පනත**

2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/34 දරන ආහාර (ප්‍රමිති අදාළ කර ගැනීමේ) නියෝග - 2008

අංක 1589/34 හා 2009 පෙබරවාරි 20 දින රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කළ 2008 ආහාර (ප්‍රමිති අදාළ කර ගැනීමේ) නියෝගය, 2009 සැප්තැම්බර් මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

නිමල් සිරිපාල ද සිල්වා,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍ය.

2009 අප්‍රේල් මස 27 වැනි දින,
කොළඹ දී ය.

06 - 359